දුම්රිය
புகையிரத
Railway } GMF 35

ඔබේ අංකය
உமது இல.
Your No. } ..............................

දුරකථනය (දු. කා.)
தொலைபேசி (இ. பு. பொ. மு.)
Telephone (G. M. R.) } 2 4 3 1 1 7 7

E-mail : gmrslr@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office } 2 4 2 1 2 8 1

ෆැක්ස්
தொலைநகல்
Fax } 2 4 4 6 4 9 0


# ශ්‍රී ලංකා දුම්රිය සේවය
## இலங்கை புகையிரத சேவை
## SRI LANKA RAILWAYS


මගේ අංකය
எனது இல.
My No. } OB.06..විවිධ/පොදු/2026

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ. පෙ. 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர் அலுவலகம்.
த. பெ. 355, ஒல்கொட் மாவத்தை.
கொழும்பு 10.

General Manager's Office,
P. O. Box 355, Olcott Mawatha,
Colombo 10.


2026.08.20

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මාර්ග හා කර්මාන්ත)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංඥා හා විදුලි)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන)
ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු
ප්‍රධාන මුල්‍ය නිලධාරී
ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල)
අධිකාරී - දුම්රිය ආරක්ෂක සේවය

**<u>රාජකාරී වේලාවන් තුළ සමාජ මාධ්‍ය (Social Media) භාවිතය සහ දුම්රිය මෙහෙයුම් කටයුතුවල සංවේදී තොරතුරු සමාජගත කිරීම වැළැක්වීම.</u>**

දුම්රිය දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන් සහ සේවකයින් විසින් රාජකාරී වේලාවන් තුළ සහ රාජකාරියට සම්බන්ධ අවස්ථාවන්හිදී විවිධ සමාජ මාධ්‍ය ජාලයන් හරහා (Facebook, YouTube, TikTok ආදී) සජීවීව (Live) සම්බන්ධ වෙමින් දුම්රිය මෙහෙයුම් කටයුතු, පාලන මැදිරි තොරතුරු, තාක්ෂණික දෝෂ, අනතුරු සහ ආයතනික සංවේදී තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය වී ඇත.

02. මෙමඟින් දුම්රිය සේවයේ විශ්වාසනීයත්වය, මගී ආරක්ෂාව සහ ආයතනික විනය බරපතල ලෙස අනතුරේ වැටෙන බැවින් වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් උපදෙස් දැඩිව අනුගමනය කළ යුතුය.

**I. රාජකාරී වේලාව තුළ හෝ දුම්රිය ස්ථාන, පාලන මැදිරි, එන්ජින් පාලක මැදිරි, වැඩපොළවල් හෝ වෙනත් ඕනෑම දුම්රිය පරිශ්‍රයක සිට කිසිදු නිලධාරියෙකුට/සේවකයෙකුට දුම්රිය මෙහෙයුම් කටයුතු, අභ්‍යන්තර තීරණ, නිල ලිපි ලේඛන හෝ ආරක්ෂක හෝ ආයතනික සංවේදී තොරතුරු සජීවීව (Live) හෝ වෙනත් ආකාරයකින් සමාජ මාධ්‍ය වෙත මුදාහැරීම සපුරා තහනම් වේ.**

03. ඉහත සඳහන් තහනමට යටත්ව, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිල තොරතුරු බාහිර පාර්ශවයන් හෝ මාධ්‍ය වෙත ලබා දිය හැක්කේ පහත සඳහන් බලයලත් නිලධාරීන්ට පමණි:

- **දුම්රිය සාමාන්‍යාධිකාරී (GMR)**: ආයතන සංග්‍රහය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස නිල ප්‍රකාශ නිකුත් කිරීමේ මූලික බලයලත් නිලධාරියා.

- **දුම්රිය නිල මාධ්‍ය ප්‍රකාශක**: මාධ්‍ය වෙත තොරතුරු සහ නිල නිවේදන ලබා දීම සඳහාම දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් ලිඛිතව පත් කරනු ලබන නිලධාරියා.

- **තොරතුරු නිලධාරියා (RTI)**: 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (RTI Act) යටතේ මහජනතාවට නිල තොරතුරු ලබා දීමට දුම්රිය මූලස්ථානයේ පත් කර ඇති නිලධාරියා.

04. **නීතිමය ප්‍රතිපාදන සහ විනය ක්‍රියාමාර්ග:** මෙම උපදෙස් උල්ලංඝනය කරමින් කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව පහත සඳහන් නීතිමය ප්‍රතිපාදන හා දුම්රිය දෙපාර්තමේන්තු උපදෙස් සංග්‍රහය සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ වැඩ තහනම් කිරීම ඇතුළු උපරිම විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ:

I. දෙපාර්තමේන්තු උපදෙස් සංග්‍රහයේ වගන්ති අංක 737 සිට 743 දක්වා ලබා දී ඇති උපදෙස් අනුව. (1985 මුද්‍රණය)

II. **ආයතන සංග්‍රහය II වැනි කාණ්ඩය - XLVII (47) පරිච්ඡේදයේ 6 සහ 7 වගන්ති:** පූර්ව අනුමැතියකින් තොරව රාජ්‍ය ප්‍රතිපත්ති හෝ පරිපාලන කටයුතු පිළිබඳව සමාජ මාධ්‍ය වෙත අදහස් ප්‍රකාශ කිරීම සහ තොරතුරු අනාවරණය කිරීම බරපතල විනය වරදකි.

III. **04/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය:** රජයේ නිලධරයන් විසින් සමාජ මාධ්‍ය ජාලා වෙත අදහස් දැක්වීම සහ තොරතුරු මුදාහැරීම සම්බන්ධයෙන් වන සීමාවන් උල්ලංඝනය කිරීම.

IV. **04/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වැනි වගන්තිය:** ආයතන සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කරමින් බාහිරට තොරතුරු සමාජගත කරන නිලධාරීන්ට දඬුවම් නියම කිරීම.

V. **ආයතන සංග්‍රහය I වැනි කාණ්ඩය - XXXII (32) පරිච්ඡේදය:** දේශපාලන අයිතිවාසිකම් හිමි නොවන නිලධාරීන් විසින් සමාජ මාධ්‍ය ඔස්සේ රජය හෝ දෙපාර්තමේන්තුව අපකීර්තියට පත්වන ප්‍රකාශ සිදු කිරීම.

05. සියලුම උප දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අංශ ප්‍රධානීන් විසින් තම සේවක මණ්ඩලය මේ පිළිබඳව වහාම දැනුවත් කර, මෙම නියෝග නිසි පරිදි ක්‍රියාත්මක වන බවට දැඩිව වගබලා ගත යුතුය.

දුම්රිය සාමාන්‍යාධිකාරී

පිටපත්:

ලේකම් - ප්‍රවාහන මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය (දැ.පි.)

අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) - (අධීක්ෂණය සහ අවශ්‍ය ක්‍රියාමාර්ග පිණිස)

අතිරේක සාමාන්‍යාධිකාරී (පාලන) - (දැ.පි. / අ.ක.ස.)

අතිරේක සාමාන්‍යාධිකාරී (කාර්මික) - (දැ.පි. / අ.ක.ස.)